# ශ්‍රී ලංකාවේ, නඩු විභාග කාල සීමාව තුළ සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම්වලට එල්ල වන අභියෝග පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්:

### වයඹ පළාත්බද හලාවත මහාධිකරණයේ අපරාධ නඩු සම්බන්ධ සාක්ෂ්‍යකරුවන් ඇසුරින්


**ඩබ්. එම්. එන්. වීරසේකර සහ ඩී. එම්. ටී. එච්. මධුෂානී**
**සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**
***nelum.sanjeewani@yaho.com***



ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාජ්‍යයන් තුළ නීතියේ ආධිපත්‍යයට ගරු කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රට පාලනය කිරීම සිදු වන අතර මූලික අයිතිවාසිකම්, කිසිදු විෂමතාවකින් තොරව, සියලුම දෙනාටම සමානව හිමි කොට දී තිබේ. එහෙත් න්‍යායාත්මකව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් සහ නීතියේ ආධිපත්‍යය පිළිගැනීමට ලක් වුවත්, විවිධාකාරයෙන් මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සහ නීතියේ ආධිපත්‍යය හැල්ලුවට ලක් වීම් සිදු වේ. රටක යුක්තිය පසිඳලනු ලබන එකම ආයතනය උත්තරීතර අධිකරණය වේ. ඒ තුළ සාක්ෂ්‍යකරුවන් අත්‍යවශ්‍ය අංගයක් වේ. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සහිත ශ්‍රී ලංකාවේ නඩු විභාග කාල සීමාව තුළ සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම්වලට අභියෝග එල්ල වීම ගැටළුවකි.

එම නිසා නඩු විභාග කාල සීමාව තුළ සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම්වලට එල්ල වන අභියෝග පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. එහිදී සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා රජය ගෙන ඇති පියවර සහ ඒ පිළිබ දැනුවත්භාවය පිළිබඳ ව අධ්‍යයනය කිරීම ද වැදගත්ය. මේ සඳහා හලාවත, වයඹ පළාත්බද මහාධිකරණයට ඇතුළත් අපරාධ නඩුවලට සම්බන්ධ සාක්ෂ්‍යකරුවන් අහඹු නියදීමේ ක්‍රමය මඟින් 50 දෙනෙක් ද නීතිඥයන් සහ පොලිස් නිලධාරීන් 20 දෙනෙක් ද ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය තුළින් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත සඳහා යොදා ගන්නා ලදී. පර්යේෂණය විසින් දත්ත විශ්ලේෂණය සඳහා *Excel* සහ *Spss* යන මෘදුකාංග භාවිත කරන ලදී.

එහි දී පර්යේෂණ සොයා ගැනීම් ලෙස (01)නඩු වාරයන් වසර හතකට වඩා කල් ගත වීම (02)සාක්ෂ්‍ය අමතක වීම, දේපල හානි, බිය වැද්දවීම්, තර්ජනය කිරීම් සහ දේශපාලන ඇඟිලි ගැසීම් සිදු වීම (04) උසාවිය තුළ සාක්ෂ්‍ය විමසන අවස්ථාවට විශ්වසනීයත්වයකින් මුහුණ දීමට සාක්ෂ්‍යකරුවන් බිය වීම (05) සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා රජය ගෙන ඇති පියවර මන්දගාමී වීම (06) සාක්ෂ්‍යකරුවන් සහ පොලීසිය තුළ පවතින සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව දැනුවත්භාවය දුර්වල වීම යනාදිය සඳහන් කළ හැකිය. සමස්තයක් ලෙස නඩු විභාග කාල සීමාව තුළ උසාවිය තුළත් ඉන් පිටතත් සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම්වලට අභියෝග එල්ල වන බව නිගමනය කළ හැකිය. ඒ සඳහා වඩා කඩිනම් නඩු කාර්ය පරිපාටියක් මෙන්ම සාක්ෂ්‍යකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා රජය මගින් විධිවිධාන සැලසීම අත්‍යවශ්‍ය වේ.



***ප්‍රමුඛ පද :*** *සාක්ෂ්‍යකරුවන්, අයිතිවාසිකම්, අභියෝග, අධිකරණය, අපරාධ, නඩු විභාග කාල සීමාව*